# ඉස්සා, මච්ජරිය, කුක්කුච්ච යෙදෙන විදිය

**ඉස්සා, මච්ජරිය, කුක්කුච්ච** යන මේ චෛතසිකයෝ තුන්දෙන ද්වේශය සමග ද්වේශ සහගත සිත්වල පමණක් ක්‍රියාත්මක වන චෛතසිකයන් බව මතක තබාගන්න.

යම්දේකට ඊර්ශියාවක් ඇතිවනවිට ද්වේශය සමග **ඉස්සා** චෛතසිකය ක්‍රියාත්මක වේ. නමුත් ඒ වෙලාවේම මච්ජරිය, කුක්කුච්ච දෙදෙන ක්‍රියාත්මක වන්නේ නැත. හේතුව නම්: ඒ වෙලාව ඊර්ශියා කරන වෙලාවක් මිස මසුරු කම් කරන හෝ කුකුස් කරන වෙලාවක් නොවන නිසාය.

යම් වෙලාවක මසුරුකමක් ඇතිවේද එවිට ද්වේශය සමග **මච්ජරිය** ක්‍රියාත්මක වෙනවා මිස ඉස්සාව හෝ කුක්කුච්චය ක්‍රියාත්මක වන්නේ නැත. එනම් එය මසුරුකම් කරන වෙලාවක් පමණක්ම වන බැවිනි.

ද්වේශ සිතත් සමග කුකුස ක්‍රියාත්මක වන වෙලාවට **කුක්කුච්ච** චෛතසිකය පමණක් ද්වේශය සමග වැඩකරනවා මිස ඉස්සා, මච්ජරිය දෙක ක්‍රියාත්මක වන්නේ නැත. ඒ නිසා ද්වේශය සමග ක්‍රියාත්මක වීමට මේ තුන්දෙනා පැමිනෙන්නේ වෙන වෙනම බව මතක තබාගන්න. එවැනි අවශ්ථාවල ද්වේශය සමග ජවන් සිත් යෙදෙන විදිය පහත සඳහන් වේ.

### දෝස මූල සිත් දෙක *ඉස්සාව* සමග

1 දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංකාරික
ඵස්සය, වෙදනා, සඤ්ඤාව, **චේතනාව**, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාරය
විතක්ක, විචාරය, අධිමොක්ඛ, වීරිය, ඡන්ද
මෝහය, අහිරික, අනොත්තප්ප, උද්ධච්චය, දෝස, ඉස්සා,

2 දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංකාරික
ඵස්සය, වෙදනා, සඤ්ඤාව, **චේතනාව**, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාරය
විතක්ක, විචාරය, අධිමොක්ඛ, වීරිය, ඡන්දය
මෝහය, අහිරික, අනොත්තප්ප, උද්ධච්චය, දෝස, ඉස්සා, ථීනය, මිද්ධය,

### දෝස මූල සිත් දෙක *මච්ජරිය* සමග

1 දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංකාරික
ඵස්සය, වෙදනා, සඤ්ඤාව, **චේතනාව**, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාරය
විතක්ක, විචාරය, අධිමොක්ඛ, වීරිය, ඡන්ද
මෝහය, අහිරික, අනොත්තප්ප, උද්ධච්චය, දෝස, මච්ජරිය

2 දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංකාරික
ඵස්සය, වෙදනා, සඤ්ඤාව, **චේතනාව**, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාරය
විතක්ක, විචාරය, අධිමොක්ඛ, වීරිය, ඡන්දය
මෝහය, අහිරික, අනොත්තප්ප, උද්ධච්චය, දෝස, මච්ජරිය, ථීනය, මිද්ධය,

### දෝස මූල සිත් දෙක *කුක්කුච්චය* සමග

1 දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංකාරික
ඵස්සය, වෙදනා, සඤ්ඤාව, **චේතනාව**, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාරය
විතක්ක, විචාරය, අධිමොක්ඛ, වීරිය, ඡන්ද
මෝහය, අහිරික, අනොත්තප්ප, උද්ධච්චය, දෝස, කුක්කුච්ච

2 දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංකාරික
ඵස්සය, වෙදනා, සඤ්ඤාව, **චේතනාව**, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාරය
විතක්ක, විචාරය, අධිමොක්ඛ, වීරිය, ඡන්දය
මෝහය, අහිරික, අනොත්තප්ප, උද්ධච්චය, දෝස, කුක්කුච්ච, ථීනය, මිද්ධය,